# මදූයි කුකූයි



ප්‍රියන්ති ජයසේකර

ග්‍රන්ථ නාමය :- මදූයි කුකූයි

කතාව :- ප්‍රියන්ති ජයසේකර

පිටකවරය සහ චිත්‍ර :- සතිනි වීරසිංහ

ISBN අංකය :- 978-624-208-133-5

මෙම කෘතියෙහි සියලුම අයිතිය කතෘ සතුය..

ප්‍රකාශය හා පළමු මුද්‍රණය : 2023 දෙසැම්බර් 22

# පිදුම

සතුන්ට කරුණාව දැක්වීම ඉතා අගනා ගුණාංගයක් බව අප දන්නා කරුණකි. වර්තමානයේ වැඩිහිටියන්ටත් වඩා කුඩා දරුවන් අසරණ අයට ආදරයෙන් කරුණාවෙන් සැලකීම, උදවු උපකාර කිරීමට ඉතා කැමැත්තක් දක්වන බව පෙනේ.

මේ ලෝකේ සත්තු අතරින් වඩාත්ම අසරණ සත්ත්වයා ලෙස මා දකින්නේ බල්ලාය. එයට හේතුව නම්, කුරුල්ලන්ට ඉගිළිලා ගොස් ආහාර ලෙස පලතුරු ආදිය ගත හැකිය. පූසන්ට ගසකට නැග සතෙකු හෝ ආහාරයට ගත හැකිය. නොතෙමී සිටිය හැකිය. මාළුවන්ට වැනි සතුන්ට ආහාර එම පරිසරයේම ඇත. නිවහනද එම පරිසරයේම ඇත. නමුත් බල්ලාට මිනිසුන්ගේ ඇසුර අවශ්‍යමය.ආහාරද මිනිසුන්ගේ ආහාරමය. එම නිසා බල්ලාට මිනිසුන්ගේ නිවෙස් අසල නිවසක් අවශ්‍යමය. මිනිසාගේ රැකවරණය අවශ්‍යමය.

දරුවන් විසින් වැඩිහිටියන් හට සත්ත්ව කරුණාවෙහි අගය වටහා දීමට ගත් උත්සහයක් ලෙස මෙම කුඩා කතාන්දරය මහනුවර මහාමායාවේ ආදරණීය දියණිවරුන්ට සහ අනෙකුත් සියලුම දූ පුතුන් හට ආදරයෙන් පිළිගන්වමි.

ප්‍රියන්ති ජයසේකර

ප්‍රාථමික අංශයේ ආචාරිණී,

මහාමායා බාලිකා විදුහල, මහනුවර

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු හවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු හවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර

2023.10.20

"ආනේ.. අම්මා, මෙන්න බලන්න මෙහාට පොඩ්ඩක් එන්නකෝ..."

"ඇයි?..ඇයි?.. මොකද චූටි දුව මම මේ වැඩක්නේ.."

"අනේ..එන්නකෝ.."

අම්මා දුවගෙන ගෙදර මිදුලට ආවාය.

"ආනේ.. බලු පැටව් ගොඩක්. කවුරුහරි දාලා යන්න ඇති. දැන් හරි වැඩේ තමයි. කාට හරි කියන්න ඕනේ..ගිහින් දාන්න කියලා.."



මදූ හරිම දුකෙන් අම්මා දෙස බැලුවාය.

"ඇයි අම්මා එහෙම කියන්නේ..?
මේ බලු පැටව් පව්නේ.. අපි සතුන්ට කරුණාව දක්වන්න ඕනි නේ අම්මා.. එයාලට යන්න තැනක් නැතුව ඇති. අපි මේ බලු පැටව් අපේ ගෙදර තියාගෙන ලස්සනට හදමුකෝ..හොඳ අම්මානේ.." පුංචි මදූ ගොඩාක් ආදරෙන් අම්මාට කීවාය.



“හා..හා.. ඔහෙ ටිකක් ඉන්න දෙමුකෝ.. එන්න මම කිරි ටිකක් හදල දෙන්නම්. වැඩිය ළඟට යන්නෙ නැතුව කිරි ටික බොන්න දෙන්න. ඊට පස්සේ හොඳට අත්දෙක සෝදගන්න ඕනේ..”

මදූට හරිම සතුටුයි.

මදූ පුංචි ගීයක් කියාගෙන බලු පැටව් ළඟට ගිහින් කිරි පෙව්වාය.



පුංචි පුංචි බලු පැටව්
රංචු රංචු වී
මිදුල පුරා දුව පනියි
හරිම සතුටු වී..

"අනේ අම්මා අක්කා තාම ආවේ නැනේ.."

"ඇයි අක්කා එන්න තව වෙලාව තියෙනවානේ.."

" නෑ... මම කිවුවේ.. මේ.. මේ.. මේ.. අම්මා අපි මේ පැටවුන්ට කූඩුවක් හදමුද? "

" අනේ මන්දා දරුවෝ බලමුකෝ.."



අම්මා එහෙම කිව්වට, මේ බලු පැටවුන්ගෙන් ගොඩාක් කරදර වෙයි කියල හිතලා.. බලු පැටව් දෙන්න, ගෙදර ළඟ ඉන්න  සිරි මාමා ට එන්න කිව්වා.

අක්කා පාසල ඇරී ගෙදර ආවාට පස්සේ පුංචි බලු පැටව් ටික අක්කාට පෙන්නුවා.

“අනේ.. හරිම ලස්සනයි. අපි මේ පැටවුන්ට කූඩුවක් හදලා දෙමුකෝ ..”



මේ අතරේ සිරි මාමා බලු පැටව් ගෙනියන්න ආවා. සිරි මාමා බලු පැටව් ටික අරගෙන පෙට්ටියකට දා ගත්තා.

අම්මා සිරි මාමාට තේ හදන්න කුස්සියට ගියා.

පුංචි මදූ , පුංචි හොර වැඩක් කරලා...
මොකක්ද දන්නවද ?
එක බලු පැටියෙක්ව කුස්සිය පැත්තේ හංගලා .

අම්මා හිතුවා.. සිරි මාමා බලු පැටව් ඔක්කොම අරගෙන යන්න ඇති කියලා.



මදූ චූටි හිනාවක් දා ගෙන අම්මා ළඟට ඇවිත්, "මේ බලන්න මගේ ළඟ ඉන්නේ කවුද කියලා.."

" හා..නේ.. ඇයි මේ පැටියව තියාගත්තේ?.." අම්මා ටිකක් සැරෙන් ඇහුවා.

මදූගේ මූණ දැකලා අම්මාටත් දුක හිතුණා. අම්මා හිතුවා ඒ පැටියා ගෙදර හිටියට කමක් නෑ කියලා..



මදූ පැටියට "චූටි කුකූ" කියලා කතා කළා.

ඌ හරිම ආසාවෙන් උඩ පැනලා පුංචි මදූ ළඟට ආවා.



“අපි එහෙනම් මේ පැටියට “චූටි කුකූ” කියලා කතා කරමු ..” යි අක්කා කිව්වා.



ඊට පස්සේ පුංචි මදූයි , චූටි කූකූයි , අක්කායි සතුටින් හිටියා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ  දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී  ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20